# 8 ශ්‍රේණිය - බුද්ධ ධර්මය

## 07 වන පාඩම - පමාබවින් මිදුණු කෙනෙක් මුළු ලෝකෙම එළිය කරයි.



# ධම්ම පදය පිළිබඳ විසා විමසාබලමු .

සූත්‍ර පිටකයේ → ඛුද්දක නිකායේ → ධම්ම පදය → වග්ග 26

↓

ගථා 423 ← පාලි අට්ඨ කථාව (ධම්මපදට්ඨ කථාවයි) ← සද්ධර්ම රත්නාවලී ග්‍රන්ථය

- හින්දු භක්තිකයින්ට භගවත් ගීතාව මෙන් ම බෞද්ධයන්ට ඉතා සමීප ග්‍රන්ථය ධම්ම පදයයි.

යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝ ච චන්දිමා

( යම් කෙනෙක් මුල දී පමා වූවත් පසු ව නුවණින් විමසා බලා නොපමා ව කටයුතු කරන්නේ නම් හෙතෙම වලාගැබින් මිදුණු පුන්සඳ මෙන් මුළු ලෝකය ම බබලවයි. )

දෙව්රම් වෙහෙරේ බුදුරදුන් වැඩසිටින සමයේ සම්මුඤ්ජනී නම් හිමිනමක් මූලික කරගෙන දේශනා කරන ලදි.

- වතාවත්වල පමණක් යෙදෙමින් සිටි සම්මුඤ්ජනී හිමියන්ට රහත් වීමට උපදෙස් ලබාදුන්නේ රේවත තෙරණුවන් වහන්සේ ය.

යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝව චන්දිමා

( යමකු විසින් කරන ලද පාප කර්මය ඔහු විසින් ම කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද ඒ තැනැත්තා වලා ගැබෙන් මිදුණු පුන්සඳ මෙන් ලෝකය බබළවයි.)

- අංගුලිමාල තෙරුන් පිළිබඳ ව දම් සභාවේ භික්ෂූන් වහන්සේලා අතර ඇති වූ සාකච්ඡාව පදනම් කරගෙන බුදුරජාණන් වහන්සේ මේ ගාථාව දේශනා කරන ලදි.



- කොසොල් රජුගේ පුරෝහිත වී සිටි ගග්ග බමුණාට දාව මන්තාණි බැමිණියට උපන් කුමාරයා අහිංසක නම් විය.

- තක්සලා නුවර දිසාපාමොක් ඇදුරිඳුගේ වැරදි අවබෝධයකින් අහිංසක කුමරා අංගුලිමාල බවට පත්විය.

## පංචානන්තර්ය පාප කර්ම

1. මව මැරීම
2. පියා මැරීම
3. රහතුන් නැසීම
4. බුදුන්ගේ ලේ සෙලවීම
5. සංඝ භේදය ඇතිකිරීම